සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

25B S I

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 13 - 2020

විභාග අංකය .............................

## යුරෝපා ඉතිහාසය I

කාලය පැය තුනයි

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමග අමුණා භාර දෙන්න.

## I කොටස

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. | 1. රෝමය | 2. නේපල්ස් | 3. වෙනිසිය | 4. කාර්තේජය | 5. ෆ්ලොරන්ස් (.....) |
| 02. | 1. ටැසිටස් | 2. ප්ලුටාක් | 3. ජුවෙනෙල් | 4. සෙනෙකා | 5. මාර්ස් (.....) |
| 03. | 1. සොක්‍රටීස් | 2. ප්ලේටෝ | 3. සොෆිගිනස් | 4. පයිතගරස් | 5. අනෙක්සිමීනිස් (.....) |
| 04. | 1. මාටිං ලූතර් | 2. ජෝන්කැල්වින් | 3. උල්රිච් ස්විංග්ලි | 4. ජෝන්හස් | 5. පැරසල්සස් (.....) |
| 05. | 1. හෙරඩෝටස් | 2. සොෆොක්ලීස් | 3. තුසිඩිඩීස් | 4. ලිවී | 5. ටැසිටස් (.....) |
| 06. | 1. හෙලිනීවරු | 2. ඔස්ට්‍රොගොත් | 3. ලොම්බාඩ්වරු | 4. ෆ්‍රැන්ක්වරු | 5. ඇංග්ලෝ සැක්සන් (.....) |
| 07. | 1. ලෆායට් | 2. නෙකර් | 3. මැරට් | 4. ඩැන්ටන් | 5. මිරාබෝ (.....) |
| 08. | 1. ලුවී | 2. viii හෙන්රි | 3. රිචලියු | 4. මැසරින් | 5. නකර් (.....) |
| 09. | 1. ලැන්කැස්ටර් | 2. ටියුඩර් | 3. බුර්බෝන් | 4. ස්ටුවර්ට් | 5. යෝක් (.....) |
| 10. | 1. පිරනීස් | 2. ඇල්ප්ස් | 3. ඇපිනයින් | 4. කැස්පියන් | 5. කාර්පේතියන් (.....) |

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

11.
1. ජෝන් කේ - දුවන නඩාව
2. ජේම්ස් හාග්‍රීව්ස් - රෙදි මැසීමේ යන්ත්‍රය
3. රිචඩ් ආක්රයිට් - ජල රාමුව
4. සැමුවෙල් ක්‍රොම්ප්ටන් - ස්පිනිං ජෙනි
5. එඩ්මන්ඩ් කාට්රයිට් - පවර්ලූම් යන්ත්‍රය (.....)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

12. 1. වෙස්ට්පේලියා ගිවිසුම - 1648
2. යුට්රේට් ගිවිසුම - 1713
3. ආඩ්‍රියානෝපල් ගිවිසුම - 1850
4. විලාෆ්‍රැන්කා ගිවිසුම - 1859
5. වර්සේල්ස් ගිවිසුම - 1919 (.....)

13. 1. තිස් අවුරුදු යුද්ධය - iv වැනි ක්‍රිස්ටියන්
2. සත්සති යුද්ධය - xv වැනි ලුවී
3. ට්‍රැපර්ගාර් සටන - i වැනි ජේම්ස්
4. ක්‍රිමියන් යුද්ධය - ii වැනි ඇලෙක්සැන්ඩර්
5. සොල්ෆාරිනෝ සටන - iii වැනි නැපෝලියන් (.....)

14. 1. නීතියේ අධිපත්‍ය - මැකියාවේලි
2. ලෙවියතාන් - තෝමස් හොබ්ස්
3. සමාජ සම්මුතිය - රූසෝ
4. ජාතීන්ගේ ධනය - ඇඩම්ස්මිත්
5. දාස් කැපිටාල් - කාල්මාක්ස් (.....)

15. 1. iv හෙන්රි - නැන්ටීස් ආඥාව
2. i එලිසබෙත් - ස්පාඤ්ඤ ආමෙඩාව
3. ජෝන් කැල්වින් - රෙපරමාදු ව්‍යාපාරය
4. ගැරිබෝල්ඩි - ඉතාලිය එක්සත් කිරීම
5. මුසෝලිනි - ii ලෝක යුද්ධය ආරම්භ කිරීම (.....)

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නවල X හා Y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස්කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. එම නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.**

| | X | | Y |
|---|---|---|---|
| 16. | 1. xiv වන ලුවී | A | ''විප්ලවය යනු මම වෙමි'' |
| | 2. නැපෝ ලියන් බොනපාට් | B | ''එකම ගංගාවකට දෙවරක් පා තැබිය නොහැකිය'' |
| | 3. සිසරෝ | C | ''සියලු දේ මනින මිම්ම මිනිසාය'' |
| | 4. ප්‍රොටගරස් | D | ''රාජ්‍ය යනු මම වෙමි'' |
| | 5. හෙරක්ලීටස් | E | ''සත්‍ය වූ නීතිය යනු ස්වභාවධර්මය හා එකඟ වූ නිවැරදි හේතු යුක්තියයි'' |

1.DAECB 2. EACDB 3. DEACB 4. BAECD 5. ABCED (.....)

| | X | | Y |
|---|---|---|---|
| 17. | 1. ලැටරන් ගිවිසුම | A | වතිකානුව ස්වෛරී රාජ්‍යයක් ලෙසත් කතෝලික ආගම ඉතාලියේ රාජ්‍ය ආගමලෙසත් පිළිගැනීම. |
| | 2. වියානා සම්මේලනය | B | යමෙක් රාජ්‍ය කරයිද ඔහුගේ ආගම රටවැසියාගේද ආගම විය යුතුය. |
| | 3. ඕග්ස්බර්ග් සාම ගිවිසුම | C | ක්‍රිස්තු භක්තියන්ට ආගමික නිදහස දීම. |
| | 4. නැන්ට්ස් ආඥාව | D | ප්‍රංශයේ ප්‍රොතෙස්තන්තවාදීන්ට ආගමික නිදහස දීම. |
| | 5. මිලාන් අඥාව | E | නීත්‍යානුකූලවාදය පිළිබඳ මූලධර්ම |

1.AEBDC 2. DEACB 3. EABDC 4. DEBCA 5. BCADE (.....)

| | X | | Y |
|---|---|---|---|
| 18. | 1. බොස්ටන් තේ සාදය | A | ප්‍රංශ විප්ලවය |
| | 2. මූල්‍ය අර්බුදය | B | රෙපරමාදු ව්‍යාපාරය |
| | 3. කොන්ස්තන්තිනෝපලය වැටීම | C | බටහිර රෝම අධිරාජ්‍ය බිඳ වැටීම |
| | 4. මිලේච්ඡ ආක්‍රමණ | D | පුනරුදය |
| | 5. කතෝලික පල්ලියේ දූෂිත බව | E | ඇමරිකන් විප්ලවය ඇතිවීම |

1.ABCDE 2. EDABC 3. AEDCB 4. EADCB 5. BCDEA (.....)

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

| | X | | Y |
|---|---|---|---|
| 19. | 1. ලිගුරියන් සිසල්පයින් හා පාර්තිනෝපියන් සමූහාණ්ඩු. | A | මැසිනි. |
| | 2. හුදු භූගෝලීය පදයක් පමණි. | B | නැපෝලියන් බොනපාට්. |
| | 3. තරුණ ඉතාලිය | C | ගැරිබෝල්ඩි |
| | 4. රතු කමිස හමුදාව | D | දෙවන වික්ටර් එමැනුවල් |
| | 5. එක්සත් කරන ලද ඉතාලිය | E | මෙටර්නික් |

1.BEACD 2. EADCB 3. AEBCD 4. BEADC 5. BEDCA (.....)

| | X | | Y |
|---|---|---|---|
| 20. | 1. පොලපොනීසියානු යුද්ධය | A | එංගලන්තය හා ප්‍රංශය |
| | 2. පියුනික් යුද්ධ | B | ක්‍රිස්තියානි හා ඉස්ලාම් භක්තිකයන් |
| | 3. සියක් අවුරුදු යුද්ධය | C | ඇතන්ස් හා ස්පාර්ටා |
| | 4. කුරුස යුද්ධය | D | ලැන්කැස්ටර් යෝර්ක් |
| | 5. රෝස යුද්ධය | E | රෝමය හා කාර්තේජය |

1.ECBAD 2. ECABD 3. CEABD 4. ACDBE 5. ECABD (.....)

- **අංක 21 සිට 25 දක්වා එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. නැපෝලියන් ප්‍රතිසංස්කරණය,
1. පැරිස් විශ්ව විද්‍යාලය ආරම්භ කිරීම. 2. පාප්තුමා සමග ආගමික සමඡයක් ඇති කර ගැනීම.
3. පුවත්පත් නිදහස ලබාදීම. 4. නීති පද්ධතිය සකස් කිරීම.
5. ප්‍රංශ බැංකුව ආරම්භ කිරීම. (.....)

22. ජාතික රාජ්‍ය,
1. බල සංකේන්ද්‍රනය. 2. වංශවතුන්ගේ බලය වැඩිවීම.
3. ජාතික ඒකීයභාවය ඉහළ මට්ටමක පැවතීම. 4. වෙළදාම පුළුල් වීම.
5. නිශ්චල දේශසීමා. (.....)

23. කාර්මික විප්ලව සමයේ ප්‍රධාන නව නිපදවීම,
1. සුළං මෝල 2. දුවන නඩාව 3. ස්පිනිං ජෙනිය
4. ජල රාමුව 5. වාෂ්ප එංජිම (.....)

24. වියානා සම්මේලනයට සහභාගී වූ ප්‍රධාන නායකයන්,
1. ඔස්ට්‍රියාවේ මෙටර්නික් 2. ප්‍රශයාවේ හාර්ඩක්බර්ග් 3. බ්‍රිතාන්‍යයේ කාසල්රි
4. රුසියාවේ සාර් ඇලෙක්සැන්ඩර් 5. සාර්ඩිනියාවේ කැවුවර්. (.....)

25. ජර්මනිය එක්සත් කිරීම,
1. 1848 ෆැන්ක්ෆර්ට් කම්මේලනය අසාර්ථක වීම.
2. 1860 දී ගැරිබෝල්ට් විසින් නේපල්ස් සහ සිසිලිය අල්ලා ගැනීම.
3. 1866 දී සත්සති යුද්ධයේදී ප්‍රශියාව ජය ගැනීම.
4. 1870-71 ප්‍රංශ- ප්‍රශියානු යුද්ධයෙන් ප්‍රභියාව ජය ගැනීම.
5. 1871 i වැනි විලියම් කෛසර් යටතේ ජර්මන් අධිරාජ්‍ය ප්‍රකාශයට පත් කිරීම. (.....)

- **අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නය දක්වා ඇති ABC හා D යන ප්‍රතිචාර අතරින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

| | |
|---|---|
| A සහ B පමණක් නිවැරදිනම් | 1 ද, |
| A සහ C පමණක් නිවැරදි නම් | 2 ද, |
| B සහ C පමණක් නිවැරදි නම් | 3 ද, |
| C සහ D පමණක් නිවැරදිනම් | 4 ද, |

වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් 5 ද වරහන තුළ ලියන්න. (.....)

NWP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | A සහ C පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදිය |

26. මධ්‍යකාලීන අවධියේ යුරෝපයේ පැවති වැඩවසම් ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ මොනවාද?
   (A) කෘෂිකර්මය මත පදනම් වූ ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය
   (B) නාගරීකරණය
   (C) විකේන්ද්‍රගත පරිපාලනය
   (D) තරගකාරිත්වය (.....)

27. පහත දැක්වෙන පුද්ගලයන් අතරින් වියානා සමුළුවට සහභාගී වූවෝ කවරහුද?
   (A) 16වන ලුවී රජු.
   (B) ටැලිරැන්ඩ්
   (C) මෙටර්නික්
   (D) i වන ජේම්ස් රජු (.....)

28. එංගලන්තයේ පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීමට තුඩු දුන් පනත්,
   (A) 1689 මහජන අයිතිවාසිකම් ප්‍රකාශ කිරීමේ පනත.
   (B) 1832 ප්‍රතිසංස්කරණ පනත
   (C) 1765 මුද්දර පනත
   (D) 1767 ටවුන්සෙන්ඩ් ගේ ආදායම් බදු පනත් (.....)

29. තිස් අවුරුදු යුද්ධයට තුඩුදුන් හේතු,
   (A) ශුද්ධ රෝම අධිරාජ්‍යා හා ජර්මන් කුමාරවරු අතර ගැටුම.
   (B) 1832 ප්‍රතිසංස්කරණ පනත
   (C) ඔග්ස්බර්ග් සම්මුතියේ අඩුපාඩු.
   (D) නැන්ටීස් ආඥාව අවලංගු කිරීම. (.....)

30. පහත දැක්වෙන පුද්ගල නම් ලැයිස්තුවෙන් ප්‍රංශ විප්ලවයට සම්බන්ධ අය තෝරා දක්වන්න,
   (A) iii වැනි ජෝර්ජ්
   (B) නැපෝලියන්
   (C) මිරාබෝ
   (D) බිස්මාර්ක් (.....)

- **ප්‍රශ්න අංක 31 - 35 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. ලතින් භාෂාවෙන් ලියැවුන බයිබලය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කළේ කවුද?
   1. මාටිං ලූතර් 2. ජෝන් හස් 3. ජෝන් කැල්වින් 4. ජෝන් ටෙට්සල් 5. රෝන් වයික්ලිෆ් (.....)

32. පාප්වරුන්ගේ පාරම්පරික මධ්‍යස්ථානය පිහිටියේ කොහේද?
   1. අවිනෝන් 2. ලන්ඩන් 3. මාසෙල්ස් 4. ජිනෝවා 5. රෝමය (.....)

33. මැග්නාකාර්ටා ප්‍රාඥප්තිය අත්සන් කරන ලද්දේ කවර රජුගේ කාලයේද?
   1. දෙවන හෙන්රි 2. තුන්වෙනි හෙන්රි 3. තුන්වෙනි ජෝන්
   4. පළමුවෙනි ඒඩ්වඩ් 5. දෙවෙනි එඩ්වඩ් (.....)

34. ඇමෙරිකානුවන් නිදහස් ප්‍රකාශය නිකුත් කළ වර්ෂය කුමක්ද?
   1. 1776 2. 1774 3. 1765 4. 1779 5. 1781 (.....)

35. රුධිර සංසරණ ක්‍රමය සම්පර්ණයෙන් සොයා ගත්තේ කවුද?
   1. පැරසල්සස් 2. විලියම් හාර්වේ 3. සර්වේට්ස්
   4. හිපොක්‍රටීස් 5. කෙප්ලර් (.....)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

- අංක 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 හා 5 වන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය මාටිං ලූතර් විසින් සංවිධානය කරන ලදි. | තිස් අවුරුදු යුද්ධයේ ප්‍රතිඵල වශයෙන් 1648 දී ජර්මනිය එක්සත් කෙරිනි. (.....) |
| 37. වැඩවසම් සමාජයේ ප්‍රධාන ලක්ෂණයක් වූයේ විශාල නගර බිහි වීමයි. | කාර්මික විප්ලවය විශාල පරිමාණ නිෂ්පාදන වලට මග පෑදීය. (.....) |
| 38. බර්ලින් තාප්පය කඩාබිඳ හෙළීම බටහිර හා නැගෙනහිර ජර්මන් රාජ්‍යවල එක්සත් භාවයට මග පෑදීය | ඔස්ට්‍රියාව හා ප්‍රංශය විසින් බිස්මාක් පරාජයට පත් කළ බැවින් ජර්මනිය එක්සත් කිරිමට ඔහු දැරූ ප්‍රයත්නය අසාර්ථක විය. (.....) |
| 39. දහසවන ලුවී රජතුමා මරණයට පත් කිරීම ප්‍රංශ විප්ලවිය හා සම්බන්ධ ප්‍රධාන සිදුවීමකි. | මොන්ටෙස්කියු විසින් බලතල වෙන්කිරීම පිළිබඳ න්‍යාය ඉදිරිපත් කරන ලදි. (.....) |
| 40. 1453 දී කොන්ස්තන්තිනෝපලය තුර්කීන් අල්ලා ගැනීම දේශගවේශනයට මගපාදන ලදි. | දේශගවේශණ යුරෝපයේ සෑම ක්ෂේත්‍රයකම පාහේ වෙනසක් සිදු කිරීමට මෙන්ම යුරෝපා පුනරුදය ඇති වීමටද බලපෑවේය. (.....) |

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25B S II

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................

# යුරෝපා ඉතිහාසය II

උපදෙස්

- **A** කොටස අනිවාර්ය වේ.
- **B** කොටසින් හා **C** කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක්වත් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

## A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| 1. සෙන් ගඟ | 2. නෝර්වේ | 3. ක්‍රීටය | 4. ඊජියන් මුහුද |
| 5. ඩාඩනල්ස් සමුද්‍ර සන්ධිය | 6. වියානා | 7. පෝලන්තය | 8. බර්ලිනය |
| 9. පිරනීස්කඳු | 10. රුමේනියාව. | 11. ලිවර්පූල් | 12. වෙනීසිය |

(ල. 12)

## B කොටස

02. (i) යුරෝපා ශිෂ්ටාචාරයේ පදනම කෙරෙහි ග්‍රීක රෝම හා ඉස්ලාම් ශිෂ්ටාචාර බලපා ඇති ආකාරය විග්‍රහ කරන්න. (ල. 16)

03. (i) නව රාජාණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ මොනවාද (ල. 7)
(ii) ස්පාඤ්ඤයේ පර්ඩිනන්ඩ් ඉසබෙලා යුවළගෙන් නව රාජාණ්ඩුවක් ගොඩනැගීමේදී ඉටුවූ සේවය පරීක්ෂා කරන්න. (ල. 9)

04. (i) ආගමික ප්‍රතිසංස්කරණ සඳහා බලපෑ හේතු පහදන්න. (ල. 8)
(ii) ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය මගින් ගත් ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ල. 8)

05. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1. වැඩවසම් ක්‍රමයේ පිරිහීම.
2. දේශගවේශන ව්‍යාපාරය
3. කාර්මක විප්ලවයේ ප්‍රතිඵල
4. ඇමරිකානු නිදහස් සටන ඇති වීමට තුඩුදුන් පසුබිම.

(ල. 8x2) = 16

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## C කොටස

06. "බොහෝ කාලයක් තිස්සේ යුධගිනි ඇවිලි තිබූ යුරෝපය යළි ගොඩනැගීමෙහිලා වියානා සමුළුවට අතිශය භාරදූර කාර්යක් පැවරුණි.''

(i). වියානා සම්මේලනවාදීන් මුහුණදුන් ගැටළු පැහැදිලි කරන්න. (ල. 3)

(ii). වියානා සමුළුව අනුගමනය කළ ක්‍රියාමාර්ග මොනවාද? (ල. 6)

(iii). වියානා සමුළුව කොතරම් දුරට සාර්ථක වී දැයි ඉහත සඳහන් ප්‍රකාශය ඇසුරින් විමසන්න. (ල. 7)

07. ''නැපෝලියන් බොනපාට් ප්‍රංශ විප්ලවයේ කාර්ය සිද්ධීන් මොහෝමයක් ඉදිරියට ගෙන ගියේය''

(i). නැපෝලියන් බොනපාට් උපත් දිවයින නම් කරන්න. (ල. 1)

(ii). 1796 දී හා 1797 දී ඔහුගේ නායකත්වය යටතේ ආක්‍රමණය කරන ලදි රටවල් දෙක නම් කරන්න. (ල. 2)

(iii). ඔහු ප්‍රංශයේ බලය අත්පත් කරගත් ආකාරය සැකෙවින් දක්වන්න. (ල. 4)

(iv). නැපෝලියන් බොනපාට් විසින් ප්‍රංශ විප්ලවයේ කාර්ය සිද්ධින් කොතෙක් දුරට ඉදිරියට ගෙන යන්නේදැයි ඔහුගේ දේශිය ප්‍රතිපත්තිය ඇසුරෙන් විමසන්න. (ල. 9)

08. 1948 - 1870 දක්වා ඉතාලිය එක්සත් කිරීමේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න. (ල. 16)

09. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහනක් ලියන්න.

(i) 1688 විප්ලවය

(ii) මාටිං ලූතර්

(iii) ප්‍රංශ විප්ලවයට බලපෑ හේතු

(iv) ජර්මනිය එක්සත් කිරීමට තිබූ බාධා (ල. 8 x 2)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

**පළමු වාර පරීක්ෂණය 2020 -යුරෝපා ඉතිහාසය.**
**පිළිතුරු 13 - ශ්‍රේණිය 1 කොටස**

| | | | |
|---|---|---|---|
| **01.** - 4 | **11.** - 2 | **21.** - 3 | **31.** - 5 |
| **02.** - 5 | **12.** - 3 | **22.** - 2 | **32.** - 5 |
| **03.** - 3 | **13.** - 3 | **23.** - 1 | **33.** - 3 |
| **04.** - 5 | **14.** - 1 | **24.** - 5 | **34.** - 1 |
| **05.** - 2 | **15.** - 5 | **25.** - 2 | **35.** - 2 |
| **06.** - 1 | **16.** - 1 | **26.** - 2 | **36.** - 3 |
| **07.** - 1 | **17.** - 1 | **27.** - 3 | **37.** - 4 |
| **08.** - 2 | **18.** - 4 | **28.** - 1 | **38.** - 1 |
| **09.** - 3 | **19.** - 1 | **29.** - 2 | **39.** - 2 |
| **10.** - 4 | **20.** - 3 | **30.** - 3 | **40.** - 5 |

**11 පත්‍රය - පිළිතුරු**

**A කොටස**

01.




**B කොටස**

02. ග්‍රීක, රෝම හා ඉස්ලාම් ශිෂ්ටාචාර වලින් යුරෝපා ශිෂ්ටාචාරයට ලැබුනු දායාද ඇසුරින් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයිය යුතු වේ.
උදා - ආගම, සාහිත්‍ය, අධ්‍යාපනය, ගෘහ නිර්මාණ ශිල්පිය චිත්‍ර මූර්ති කැටයම්, විද්‍යාත්මක සොයා ගැනීම්, නීති ක්‍රම ආදිය. උදාහරන සහිතව විස්තර වීම. (ල. 16)



**මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.**

03. (i) * නිශ්චිත භූගෝලීය දේශ සීමාව
* ස්වෛරී රාජාණ්ඩුව
* රජු ස්ථර හමුදාවක් පවත්වාගෙන යාම
* ජාතික බඳු ප්‍රතිපත්තිය
* ප්‍රාදේශීය නායකයන්ගේ බලය සීමා වීම.
* පෞද්ගලික නිලකාර හමුදාව අහෝසි කිරීම.
* ජාතික නීති පද්ධතියක් බිහි වීම.

මෙම කරුණු උදාහරණ සහිතව විස්තර කළ යුතුය. (ල. 7)

(ii) * 1469 අරගන්හි ෆර්ඩිනන්ඩ් කුමාරයා කැස්ටීල්හි ඉසබෙලා කුමරිය අතර ඇතිවූ විවාහය.
* 1492 ග්‍රැන්ඩාවත් 1512 නවාර් රාජ්‍යයක් ඈඳා ගැනීම.
* දේශගවේශන මගින් භාහිර ප්‍රදේශ ස්පාඤ්ඤයට ඈදාගෙන එහි ශක්තිය හා ශ්‍රේෂ්ඨත්වය වැඩි කිරීම.
* පත්වලින්, නේපල්ස්, සිසිලි, සාර්ඩිනියා ප්‍රදේශවල ස්පාඤ්ඤයේ ආධිපත්‍ය පිහිටුවීම.
* ශුද්ධ රෝම අධිරාජ්‍ය සමඟ ඥාති සබඳතා ඇතිකර ගැනීම.
* ප්‍රතිසංස්කරණ ඇති කිරීම.
* වංශාධිපති බලය දුර්වල කිරීම හා මධ්‍යම පන්තියේ බලය වැඩි කිරීම.
* පොදු නීති පද්ධතියක් ඇති කිරීම.
* ආගමික ප්‍රතිසංස්කරණ ඇති කිරීම. (ල.9)

04. (i) ආගමික, ආර්ථික දේශපාලනික, බුද්ධිමය හේතු වෙන වෙනම විස්තර කරන්න.

(ii). ජේසු සංගමය පිහිටුවීම.
ට්‍රෙන්ට් සම්මේලනය කැඳවීම.
අධර්ම මර්ධනාධි කරණය.
විරුද්ධවාදීන්ව පුලුස්සා මරා දැමීම හෝ දඬුවම් කිරීම.
මෙම කරුණු උදාහරණ සහිතව විස්තර කරයුතුය. (ල.8)

05. නිවැරදි කරුණු සඳහා ලකුණු ලබා දෙන්න. (ල. 8 x 2 = 16)

## C කොටස

06. (i) * නැපෝලියන්ගේ ක්‍රියාකලාපය නිසා අවුල් වූ යුරෝපය නැවත පෙර තිබූ තත්වයට ගෙන ඒම.
* ප්‍රංශය නැවත බලවත් වීම වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කිරීම.
* ප්‍රංශ විප්ලවයේ අදහස් යුරෝපා රටවලට පැතිර යාමට තිබූ ඉඩකඩ ඇහිරීම
* ස්ථාවර ආණ්ඩු පිහිටුවීම.

(ii) * නීත්‍යානුකූල වාදය පිළිගැනීම.
* ප්‍රංශය තුල පැරණි රාජාණ්ඩු ස්ථාපිත කිරීම
* ප්‍රංශය 1792 වන විට පැවති දේශ සීමාවලට සීමා කිරීම.
* ප්‍රංශය සතු ඇතැම් ප්‍රදේශ අනෙක් රටවලට පවරාදීම
* නෝර්වේ ස්වීඩන් ඒකබද්ධ කිරීම
* ස්විට්සර් ලන්තය ස්වාධීන රාජ්‍යක් ලෙස පිළිගැනීම
* ප්‍රංශයට දඬුවම් නියම කිරීම
මෙම කරුණු උදාහරණ සහිතව විස්තර කළ යුතුය. (ල.6)

07. (i) කෝර්සියා. (ල.1)

(ii) ඉතාලිය හා ඔස්ට්‍රියාව (ල.2)

(iii) * කාලතුවක්කු භටයෙකු ලෙස ප්‍රංශ හමුදාවට බැඳීම
* එංගලන්ත හමුදාවට පහරදීම.
* අධ්‍යක්ෂමණ්ඩලයට විරුද්ධව පැන නැගි කැරලිමර්ධනය කිරීම
* ඉතාලි, ඔස්ට්‍රියන් සටන ජය ගැනීම
* කොන්සල් ක්‍රමයක් ඇති කිරීම
* පළමුවෙනි කොන්සල් හා යාවජීව කොන්සල් බවට පත් වීම.
* ප්‍රංශ අධිරාජයා ලෙස ඔටුනු පැළඳීම. (ල. 4)

(iv) පාලනය, අධ්‍යාපනය, ආගම, අධිකරණ, ආර්ථික පොදුජන සේවා යන මාතෘකා යටතේ දේශීය ප්‍රතිපත්තිය විස්තර කරන්න. (ල.9)

08. (i) අදාල පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ල. 16)

(ii) අදාල කෙටි සටහනට ලකුණු ලබාදෙන්න. (ල. 8x2 = 16)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

WWW.LOL.LK

# BUY

## PAST PAPERS

## 071 777 4440

Buy Online - www.LOL.lk

- GCE O/L
- GCE A/L
- PAST PAPERS
- SHORT NOTES




Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

LOL.lk
Learn Ordinary Level

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

HUGE SALE – SHOP NOW




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

- GCE O/L Exam




GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART





GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00




GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00




GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00